**කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය**

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචිව විදේශ රැකියාවන්හී නිරත/නිරතව සිටි ශ්‍රමිකයින්ගේ දූ දරුවන් වෙනුවෙන් ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම-2024**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචිව රැකියා සඳහා විදේශගතව සිටි/සිටින දෙමාපියන්ගේ දූ දරුවන් වෙනුවෙන් 2024 වර්ෂය සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීමට පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගෙන් අයදුම්පත් මාර්ගගත ක්‍රමය ඔස්සේ (online) කැඳවනු ලැබේ. **(www.slbfe.lk වෙබ් අඩවියට පිවිස මේ සඳහා අයදුම් කල හැක)**

**සුදුසුකම්**

**අ) 5 වසර ශිෂ්‍යත්ව**

- අදාල අයදුම්කරුගේ මව හෝ පියා 2018.10.15 දින සිට 2023.10.15 දින දක්වා අතර කාලය තුල කාර්යාංශයේ ලියාපදිංචිය ලබා විදේශ ගත වී රැකියාවක නිරතව සිටිය යුතුය.
- 2023 වර්ෂයේ පැවති 5 වසර ශිෂ්‍යත්ව විභාගයෙන් දිස්ත්‍රික්ක කඩඉම් ලකුණු ලබා සමත් විය යුතුය.

**උඩුගත කළ යුතු (Upload ) අත්‍යාවශ්‍ය ලේඛණ**

- අයදුම්කරුගේ උප්පැන්න සහතිකයේ මුල් පිටපතක්
- විභාග දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද විභාග සහතිකයේ මුල් පිටපතක්
- විදේශගත මව/පියාගේ විදේශ ගමන් බලපත්‍රයේ ඡායාරූප සහිත පිටුවේ පිටපතක්

**සැළකිය යුතුයි**

දරුවාගේ **විභාග දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන** ලද විභාග සහතිකයේ හා උප්පැන්න සහතිකයේ පිටපත් දරුවා ඉගෙනුම ලබන පාසලේ විදුහල්පතිතුමා විසින් සහතික කර පහතින් සඳහන් කර ඇති ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන ලෙස හා එම ලිපි ලේඛනවල දකුණු පස ඉහල කෙළවරේ අයදුම් පත්‍රය සම්පූර්ණ කිරීමෙන් පසු ඔබට ලැබෙන යොමු අංකය (Reference No.) සඳහන් කර එවන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

**ආ) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) ශිෂ්‍යත්ව**

- අදාල අයදුම්කරුගේ මව හෝ පියා 2018.05.29 දින සිට 2023.05.29 දින දක්වා අතර කාලය තුල කාර්යාංශයේ ලියාපදිංචිය ලබා විදේශ ගත වී රැකියාවක නිරතව සිටිය යුතුය.
- 2022 වර්ෂයට අදාල අ.පො.ස. (සා/පෙළ) විභාගය අවම වශයෙන් ගණිත විෂය ඇතුළුව විෂයන් 06 කින් සමත්ව ඉන් විෂයන් 03 ක් සඳහා සම්මාන සාමාර්ථ සහිතව අ.පො.ස (උ/පෙළ) හදාරමින් සිටින ශිෂ්‍ය ශිෂ්‍යාවන් විය යුතුයි.

**උඩුගත කළ යුතු ( Upload ) අත්‍යාවශ්‍ය ලේඛණ**

- අයදුම්කරුගේ උප්පැන්න සහතිකයේ මුල් පිටපතක්
- විභාග දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද අ.පො.ස.(සා/පෙළ) විභාග සහතිකයේ මුල් පිටපතක්
- අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පතේ පිටපතක්
- විදේශගත මව/පියාගේ විදේශ ගමන් බලපත්‍රයේ ඡායාරූප සහිත පිටුවේ පිටපතක්

**සැළකිය යුතුයි**

දරුවාගේ **විභාග දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන** ලද විභාග සහතිකයේ හා උප්පැන්න සහතිකයේ පිටපත් දරුවා ඉගෙනුම ලබන පාසලේ විදුහල්පතිතුමා විසින් සහතික කර පහතින් සඳහන් කර ඇති ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන ලෙස හා එම ලිපි ලේඛනවල දකුණු පස ඉහල කෙළවරේ අයදුම් පත්‍රය සම්පූර්ණ කිරීමෙන් පසු ඔබට ලැබෙන යොමු අංකය (Reference No.) සඳහන් කර එවන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

**ඇ) අ.පො.ස (උසස් පෙළ) ශිෂ්‍යත්ව**

- අදාල අයදුම්කරුගේ මව හෝ පියා 2018.01.23 දින සිට 2023.01.23 දින දක්වා අතර කාලය තුල කාර්යාංශයේ ලියාපදිංචිය ලබා විදේශ ගත වී රැකියාවක නිරතව සිටිය යුතුය.
- 2022 වර්ෂයට අදාල අ.පො.ස (උසස් පෙළ) සමත් වී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් රජයේ හෝ පෞද්ගලික විශ්ව විද්‍යාලයක උපාධි පාඨමාලාවක් හෝ අ.පො.ස (උසස් පෙළ) සමත්ව ජාතික කාර්මික විද්‍යාලයක හෝ වෙනත් රජයේ අධ්‍යාපන ආයතනයක වසර 2කට වැඩි ඩිප්ලෝමා පාඨමාලාවක අධ්‍යාපනය හදාරමින් සිටිය යුතුය.

**උඩුගත කළ යුතු ( Upload ) අත්‍යාවශ්‍ය ලේඛණ**

- අයදුම්කරුගේ උප්පැන්න සහතිකයේ මුල් පිටපතක්
- විභාග දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද අ.පො.ස (උසස් පෙළ) විභාග සහතිකයේ මුල් පිටපතක්
- අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පතේ පිටපතක්
- අදාල අධ්‍යාපන ආයතනයේ ලේඛකාධිකාරී විසින් නිකුත් කරන ලද ශිෂ්‍යභාවය සහතික කරන ලද ලිපියේ මුල් පිටපතක්
- විදේශගත මව/පියාගේ විදේශ ගමන් බලපත්‍රයේ ඡායාරූප සහිත පිටුවේ පිටපතක්

**සැළකිය යුතුයි**

දරුවාගේ **විභාග දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන** ලද විභාග සහතිකයේ හා උප්පැන්න සහතිකයේ පිටපත් දරුවා ඉගෙනුම ලබන පාසලේ විදුහල්පතිතුමා විසින් සහතික කර පහතින් සඳහන් කර ඇති ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන ලෙස හා එම ලිපි ලේඛනවල දකුණු පස ඉහල කෙළවරේ අයදුම් පත්‍රය සම්පූර්ණ කිරීමෙන් පසු ඔබට ලැබෙන යොමු අංකය (Reference No.) සඳහන් කර එවන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

**ඉතා වැදගත්**

- එකම කාණ්ඩයේ ශිෂ්‍යත්වයක් සඳහා අයදුම්කල හැක්කේ එක් වරක් පමණි.
- අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2024.12.31 වේ.

**ලිපිනය- කළමනාකරු (සුභසාධන),**
**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය,**
**5 වන මහල, මෙහෙවර පියෙස,**
**නාරාහේන්පිට, කොළඹ-05.**

දුරකථන අංකය( **0112365471**

**www.slbfe.lk** යන කාර්යාංශ වෙබ් අඩවියෙන් තොරතුරු ලබා ගත හැක.

සභාපති

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය